**නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය - 2023**

**-----------------------------------------------------------------**

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 දරන ණය ගිවිසුමේ 4.02 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රමුඛ නාගරික ව්‍යාපෘති සඳහා සක්‍රීය ඉහළ මට්ටමේ සූදානමක් ඇති කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,090.98 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.74 ක් වන අතර ඉන් රු.මිලියන 883.88 කට සමාන එ.ජ.ඩො. මිලියන 4.65ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රුපියල් මිලියන 207.10 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර 2022 මාර්තු 31 දින වන විට නිමකිරිමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගෝස්තු 18 දිනැති අංක ER/AB/US/01(vol i) දරන ලිපිය ප්‍රකාරව එම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු සියල්ල 2020 වර්ෂය අවසානයේදී නතර කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති කටයුතු 2022 මාර්තු 31 සිට නැවත ක්‍රියාත්මක කර තිබුණු අතර ආසියානු සංවර්ධන බැංකුවේ 2022 අප්‍රේල් 27 දිනැති ලිපිය ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් කලයුතු දිනය 2024 මාර්තු 31 දින දක්වා නැවත කාලය දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2023 දෙසැම්බර් 31 දිනට නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති,රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 ජූලි 25 දිනැති විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක SC&PMU/ප්‍රදාන/19 | ශ්‍රී ලංකා රජයට ලැබෙන සියලුම විදේශ ප්‍රදාන සහ තාක්ෂණික සහාය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.<br>කෙසේ වෙතත් ව්‍යාපෘතිය සඳහා ලැබුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 01ක තාක්ෂණික සහාය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මෙම තාක්ෂණික ආධාර ප්‍රදානයට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශය ගිවිසුමක් අත්සන් කර නොමැත. | ශ්‍රී ලංකා රජයට ලබා දෙන සියලුම විදේශ ප්‍රදාන සහ තාක්ෂණික සහාය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| රථවාහන ප්‍රවාහනය සහ සංචලනය සඳහා උපදේශන වාර්තා 13ක්, නාගරික වැඩිදියුණු කිරීම සහ උරුමයන් සංරක්ෂණය සහ ධාරිතා ගොඩනැගීම සඳහා උපදේශන වාර්තා 04ක් සහ පරිසර කළමනාකරණ සේවාව සඳහා උපදේශන වාර්තා 05ක් වශයෙන් පළමු හා අවසාන වාර්තා සැකසීම සඳහා පෞද්ගලික සමාගම් තුනකට භාර දී තිබුණි. කෙසේ වෙතත්, මෙම උපදේශන වාර්තා සම්බන්ධයෙන් ව්‍යාපෘතිය කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | උපදේශන කොන්ත්‍රාත්තුවල පිරිවැය සහ කාලය මත පදනම් වූ කොන්ත්‍රාත් ස්වභාවය හේතුවෙන් ඉදිරිපත් නොකළ ලේඛන ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයට ඉල්ලා සිටිය නොහැක. | උපදේශන වාර්තා කාල සීමාව තුළ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ ප්‍රමාදය

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය | ප්‍රමාදය මාස | ප්‍රමාදය/ විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | වාර්තා ගණන | | | |
| උපදේශන වැඩ | | | | | |
| | ව්‍යාපෘති ලැයිස්තුවේ සත්‍යාපනය | 2022 දෙසැම්බර් | 12 | උපදේශන වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය | කාල රාමුව වෙනස් කර ඇත. |
| | ශක්‍යතා වාර්තා සකස් කිරීම | 2023 මාර්තු | 09 | | |
| | සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තා සකස් කිරීම | 2023 සැප්තැම්බර් | 03 | | |
| | O & M සැලැස්ම සකස් කිරීම | 2023 නොවැම්බර් | 01 | | |

| | |
|---|---|
| කළමනාකරණයේ ප්‍රතිචාරය | මුදල් අමාත්‍යාංශය යටතේ UPPF පහසුකාරක කමිටුවක් පිහිටුවීමෙන් පසු, කමිටුව එහි අවසන් දිනය වන 2023.10.31 දක්වා සූදානම් කිරීමේ කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලෙස ADB වෙතින් ඉල්ලා ඇත. එබැවින් කාල රාමුව ඒ අනුව වෙනස් කර ඇත. |
| විගණකගේ නිර්දේශය | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කර ඇති අතර ව්‍යාපෘතියේ පෙර විෂය පථය වෙනස් කර 2024 මාර්තු 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබූ ත්‍රිකුණාමලය සහ දඹුල්ල දිස්ත්‍රික්ක යටතේ වෙනත් විෂය පථයක් සමඟ ආරම්භ කර ඇත.<br>නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට ඉලක්ක සපුරා ගැනීම අඩු මට්ටමක පැවතිමෙන් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම විගණනයේදී ගැටළු සහගත විය. | ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2024.03.31 සිට 2024.12.31 දක්වා කාලය දීර්ඝ කරන ලෙස ලේකම්, MUD විසින් ADB වෙතින් ඉල්ලා ඇත.<br><br>කාලය දීර්ඝ කිරීම සඳහා කැබිනට් අනුමැතිය ද ලැබී ඇති නමුත් ආසියානු සංවර්ධන බැංකුව විසින් 2024.03.31 වන විට UPPF ණය අවසන් කර ඇත. ඉහත සඳහන් කළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මත පදනම්ව ප්‍රමාදයන් ඇති විය. | නියමිත කාල සීමාව තුළ වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 මාර්තු 31 වන විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාකාරකම් 10ක් ආරම්භ කර නොතිබුණි. | තවමත් සවිස්තරාත්මක නිර්මාණ සැලසුම් කරමින් පවතී. UPPF හි ණය අවසන්වීම හේතුවෙන් කාලය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත පරිදි තීරණය නොලැබීම මත හා ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව නොදීම මත සැලසුම් කල පරිදි එම කාර්යයන් සිදුකල නොහැකි විය. | වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මෙම ව්‍යාපෘතිය සඳහා දඹුල්ල, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ රත්නපුර යන නගර තෝරාගෙන ඇති අතර ඒ සඳහා 2019 සිට 2022 දෙසැම්බර් 31 දක්වා සංරචක 3ක් යටතේ රුපියල් මිලියන 418.29ක් වැය කර ඇත. 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය අත්හිටුවීමෙන් සහ 2024 මාර්තු 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමෙන් පසු විෂය පථය වෙනස් කර ත්‍රිකුණාමලය සහ දඹුල්ල දිස්ත්‍රික්කවලට පමණක් ප්‍රමුඛත්වය දෙන ලදී. එබැවින් එම දිස්ත්‍රික්ක වෙනුවෙන් මේ දක්වා ව්‍යාපෘතිය මගින් වැය කර ඇති මුළු මුදල නිෂ්ඵල වියදම් ලෙස විගණනයේ දී හඳුනා ගැනේ. | මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ව්‍යාපෘතිය නැවත සක්‍රීය කිරීමේදී ත්‍රිකුණාමලය සහ දඹුල්ල ප්‍රදේශවල සංචාරක පහසුකම් සහ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත. අමාත්‍යාංශය ශ්‍රී ලංකා රජය ගන්නා ප්‍රතිපත්තිමය තීරණයට අනුගත විය යුතුය. එබැවින් කුරුණෑගල සහ දඹුල්ල ව්‍යාපෘති සූදානම් කිරීමේ කටයුතු සඳහා කරන ලද වියදම් පිළිබඳව අමාත්‍යාංශයට කරුණු දැක්වීම කළ නොහැක. | ව්‍යාපෘතියට අදාළ කටයුතු සඳහා පමණක් සැලසුම් සහගතව වියදම් කිරීමට අවධානය යොමු කළ යුතුය. |

**3.5 පද්ධති හා පාලන**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමේදී පූර්ව උපදේශන වාර්තාවල උපයෝගීතාව සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සැලකිල්ලට ගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් මෑත කාලීන සංවර්ධන මැදිහත්වීම් සඳහා පෙර කාර්යයන් භාවිතා කිරීම වඩාත් විවේචනාත්මක වේ. ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්කිරීම ශ්‍රී ලංකා රජයේ සාමූහික තීරණයකි. | පූර්ව උපදේශන වාර්තා ඵලදායී ආකාරයෙන් භාවිතා කළ යුතුය. |